**ශ්‍රී ලංකා පදනම**

-------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා පදනම 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පදනමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිති 24 ප්‍රකාර රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන් ලැබීමේදී එය විලම්භිත ආදායමක් ලෙස සලකා ප්‍රාග්ධනිත කර අදාල වත්කමේ ජීවිත කාලය පුරා ක්ෂය ප්‍රතිපත්තියට සමාන්තරව අදාල ප්‍රදානය අදායමට හඳුනාගැනීම කළයුතු වුවත්, පදනම විසින් ඊට පටහැනිව ලද සම්පූර්ණ ප්‍රදානයම සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

(ආ) ප්‍රමිති 18 ට අනුකූලව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද භාවිතයේ පවතින පිරිවැය රු. 55,167,011 ක්වූ ගොඩනැගිලි, පිරියත, කාර්යාල උපකරණ හා සවිකිරීම් සහ වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

ශ්‍රී ලංකා පදනමේ සේවකයින් සඳහා ආපදා ණය සහ උත්සව අත්තිකාරම් ප්‍රදානය කරනු පිණිස අවුරුදු 22 කට පෙර ආයතනයේ පහසුකම් බාහිර පාර්ශවයන් වෙත කුලියට දීමෙන් උපයාගත් ආදායමින් අරමුදල් සපයාගෙන ආරම්භ කර පවත්වාගෙන ආ ණය අරමුදලේ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු. 15,221,429 ක මුදල ශේෂ පත්‍රයේ වෙන් වශයෙන් පෙන්වනවා වෙනුවට එදිනට සමුච්චිත අරමුදලට ඇතුළත් කර පෙන්වා තිබුණි.

### 1.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

2003 වර්ෂයේදී ඩිප්ලෝමා ප්‍රකාශන පත්‍ර මුද්‍රණය කිරීම සඳහා ආයතනයක් වෙත ලබාදී වසර 07 කට අධික කාලයක් ගතවීත් කාර්යය නිමනොවූ හෝ නැවත නොලැබුණ රු.87,500 ක අත්තිකාරම් ශේෂයක් දක්නට ලැබුණි.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පිළිබඳ අවස්ථාවන් පහත දැක්වේ.

| | නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1963 නොවැම්බර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තිරණ අංක 1024එෆ/600/20/සිඩි හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පිඊඩී/12 හි 9.14 ඡේදය | පදනම විසින් 2009 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලද එහි මුල්‍ය හා පරිපාලන අත්පොත සඳහා අමාත්‍යාංශයේ හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 371 | කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා වරකදී ලබා දිය හැකි උපරිම අත්තිකාරම් ප්‍රමාණය වන රු.20,000 ක සීමාව ඉක්මවා අවස්ථා 29 කදී රු.1,167,625 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබා දී ඇති බව නිරීක්ෂණය විය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 502(2) හා 11 වන පරිශිෂ්ඨය | ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම හා ඉවත් කිරීම සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම මත රු.1,185,376 ක පිරිවැය වූ ස්ථාවර වත්කම් විකිණීමට කටයුතු කොට තිබුණ. එම එක් එක් වත්කම හා පවතින ස්ථානය හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වූ අංකනය කිරීමක් ලේඛනයේ නොමැති වීම හේතු කොට ගෙන එම වත්කම් හදුනා ගෙන ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කොට නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඒඩී 12 දරන යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 9.2. ඡේදය | විධිවිධාන පරිදි කටයුතු නොකොට 2010 වර්ෂය තුළදී ආයතනය විසින් සේවකයින් 28 දෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් පත්කර ඇත්තේ අනුමත සේවක සංඛ්‍යාව තුළ බව සභාපති දැනුම් දී ඇත. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

-------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, භාණ්ඩාරයෙන් ලද රු.37,000,000 ක් වූ පුනරාවර්තන ආධාර සැලකිල්ලට ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂය සඳහා පදනමේ ක්‍රියාකාරකම් වලින් රු.14,768,310 ක ඌනතාවයක් සිදුවී තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.11,540,464 ක් වූ ඌනතාවය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රු.3,227,846 ක ඌනතාවයේ වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඌනතාවය පෙර වර්ෂයට සාපේක්ෂව වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන රු. 5,000,000 කින් අඩුවීමද නඩත්තු වියදම් , සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය වියදම් හා වෙනත් මෙහෙයුම් වියදම් රු. 7,409,747 කින් වැඩි වී තිබීම බලපා ඇති බව නිරීක්ෂණය විය.

#### 2.1.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

---------------------------------

පහත සඳහන් ගනුදෙනු නිරීක්ෂණය විය.

(අ) 1999 ඔක්තෝබර් 08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 හි 1.1.6 ඡේදය ප්‍රකාරව නිල වාහන සඳහා හිමිකම් නොමැති නිලධාරිනියක් අධිසේවක පදනම මත ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනයේ සහකාර අධ්‍යක්ෂ තනතුරකට පත්කර තිබුණු අතර එම නිලධාරිනියට ස්ථිර ඉන්ධන දීමනාවක් 2006 වසරේ සිට ගෙවා තිබුණි.

(ආ) 2004 වර්ෂයේදී ජනාධිපති ලේකම් විසින් පත්කරන ලද ටෙන්ඩර් මණ්ඩලයේ තීරණයක් පරිදි ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. මිලියන 18.74 වටිනා ටෙන්ඩරයක් පිරිනමා තිබුණි. නියමිත අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්තුව නතර කිරීම හේතුවෙන් ගෙවා තිබුණු රු. 3,419,918 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම 2011ජුනි 30 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වර්තමානයේදී මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජිත ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් ඉහළ උසාවියේ නඩුවක් විභාග වෙමින් පවතින බව සභාපති දැනුම් දී ඇත.

(ඇ) 2011 ජුනි 30 දිනට පදනම් ආයතනය යටතේ අංශයක් වශයෙන් කයාත්මක වූ ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය 2010 අප්‍රේල් 30 සිට ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට ගෙන තිබුණු අතර පදනම විසින් එදින සිට 2010 දෙසැම්බර් 31 දක්වා පුනරාවර්තන වැය වශයෙන් රු. 13,947,353 ක් වැය කර තිබුණි.

2.1.3 **අවිධිමත් ගණුදෙනු**

---------------------

කොන්ත්‍රාත් පදනම මත සේවය කළ අධ්‍යක්ෂවරයෙකු 2005 ජුනි 03 සිට 2005 අගෝස්තු 21 දක්වා පුද්ගලික නිවාඩු මත විදේශ සංචාරයේ යෙදී ඇති අතර එම කාලය තුල ඔහුට ගෙවා ඇති රු.122,720 ක දීමනාව හා ඔහුගෙන් අයවිය යුතු රු. 161,269 ක මුදලක් ඇතුළුව එකතුව රු. 283,989 ක මුදලක් 2011 මාර්තු 31 දක්වාම අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

2.2.1 **කාර්ය සාධනය**

-------------------

පහත සඳහන් නිර්ක්ෂණයන් කරනු ලැබේ

(i) **ශ්‍රී ලංකා රූපවාහිණී අභ්‍යාස ආයතනය**

-------------------------------------------

(අ) ක්‍රියාකාර් සැලසුමට අනුව වැඩසටහන් 41 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණත් 2010 නොවැම්බර් 01 දින වන විටත් ඉන් වැඩ සටහන් 19 ක කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) ආයතනය පුහුණු පාඨමාලා පැවැත්වීමට අදාළ සැලසුම් සකස් කිරීමේදී, හා එක් එක් පාඨමාලා සඳහා ඇස්තමේන්තු සැකසීමේදී පාඨමාලා ආදායම වන රු.4,532,456 න් 53% ක් ව රු. 2,417,188 ක විදුලි වියදම් ඇතුලත් කර ඇස්තමේන්තු කර නොතිබුණ අතර ඒ අනුව පාඨමාලා ගාස්තු හා ලාභ ආන්තිකයන් නිවරදිව තීරණය කර නොමැති බව නිර්ක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා රූපවාහිනි අභ්‍යාස ආයතනය එහි අවශ්‍යතාවය සඳහා 2006, 2008 හා 2009 යන වර්ෂයන්හිදි රු. 13,759,266 ක් වැයකර නවීන උපකරණ මිලදි ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුල අපේක්ෂිත පාඨමාලා පැවැත්වීමට නොහැකි

වීමත්, උපකරණ හා පහසුකම් කුලියට ඒම අඩුවීමත් හේතු කොටගෙන අදාල උපකරණ වර්ෂය තුල ඵලදායීව ප්‍රයෝජනයට ගෙන නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ඉ) ශ්‍රී ලංකා රූපවාහිනි අභ්‍යාස ආයතනයෙ පසුගිය වර්ෂ 03 ක ආදායම් 2007 වර්ෂයේ අදායම් සමග සැසදීමේදී අඩුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණි.

| | 2007 | 2008 | 2009 | 2010 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| පුහුණු පාඨමාලා ආදායම | 2,588,127 | 2,336,000 | 4,103,931 | 3,927,239 |
| පහසුකම් කුලියට දීමේ ආදායම | 9,435,552 | 8,234,461 | 1,734,796 | 605,218 |
| මුළු ආදායම | 12,023,679 | 10,570,461 | 5,838,727 | 4,532,457 |
| ආදායම අඩුවීම 2007ට සාපේක්ෂව | | 12.08% | 51% | 62% |

### 2.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

2007 ඔක්තෝබර් 20 දින ආරම්භකොට 2008 වර්ෂයේදී නිමවීමට නියමිතව තිබූ රු. 8,638,300 ක් වූ (US 78,530) ඇස්තමේන්තු ගත වියදමක් යටතේ ආපදා අවදානම් අවම කිරීමේ පර්යේෂණ අධ්‍යයනය කටයුතු සඳහා වූ ඔක්ස්ෆැම් ව්‍යාපෘතියෙ ක්‍රියාකාර සැලැස්ම නිසිපරිදි සකස් නොකිරීම නිසා 2010 දෙසැම්බර් 31 දින වනවිටත් රු. 1,586,761 ක ශේෂයක් ඉතිරි වී තිබුණි.

### 2.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පාඨමාලා පරිපාලන කටයුතු සඳහා ස්ථිර දේශකවරුන් හට ලේකම්වරු 05 ක් සිටියදී ස්ථිර දේශකවරු 6 දෙනාගේ 2010 වසරේ මුල් මාස 06 ක කාර්යය සාධනය පරීක්ෂා කිරීමේදී ඔවුන් දේශනවලට සහභාගිවීම පහළ මට්ටමක පැවැති බව නිරීක්ෂණය විය.

3. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී අනාවරණයවූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පදනමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ආ) වාහන උපයෝජනය